14. මෙම තාරකා විද්‍යාඥයා අඳින ලද ලෝක සිතියමක ශ්‍රී ලංකාව ද ලකුණු කර තිබුණි,
(1) ක්ලෝඩියස් ටොලමි (2) ටයිකෝ බ්‍රාහේ
(3) සැමොස් ඇරුස්ටාකස් (4) ගැලිලියෝ ගැලිලි

15. පෘථිවියේ සිට අහස දෙස බලන විට පෙනෙන දෘශ්‍ය ගෝලය හැඳින්වෙන්නේ,
(1) රාශි චක්‍රය ලෙසිනි. (2) ඛගෝලය ලෙසිනි.
(3) සමකය ලෙසිනි. (4) ක්‍රාන්ති වලය ලෙසිනි.

16. ජීවි මෙන් ම අජීවි පරිසරය සමතුලිතව පවත්වා ගනිමින් නිරතුරුව පරිසරයේ වෙනස්වීම් සිදුවීම හඳුන්වන්නේ,
(1) පරිසරය සංරක්ෂණය ලෙස ය. (2) පරිසරයේ සිදුවන අන්තර්ක්‍රියා ලෙස ය.
(3) පරිසරයේ ගතික ස්වභාවය ලෙස ය. (4) පරිසරයේ ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය ලෙස ය.

17. පරිසරය අධ්‍යයනයක දී එක් ජීවියෙකු තව ජීවියෙකු මත යැපෙමින් හානියක්/අවාසියක් ඇති කිරීමට සමත්වන අන්තර් ක්‍රියාවකට නිදසුනකි.
(1) නිදිකුම්බා ශාකයක මූල ගැටිත්තක් තුළ බැක්ටීරියාවක් ජීවත් වීම.
(2) ශාකයක අතු මත ඕකිඩ් වැනි අපිශාක වර්ධනය වීම.
(3) පිළිල ශාකයක් අඹ අත්තක කෙළවරක වර්ධනය වීම.
(4) මී මැස්සෙකු මලකින් පැණි උරාබීම.

18. ජීවින් අතර තරගයක් ඇති නොවන්නේ **පහත කවර සාධකය සපුරා** ගැනීම සඳහා ද?
(1) ශ්වසනය කිරීමට (2) ආහාර ගැනීමට
(3) ජලය ලබා ගැනීමට (4) ප්‍රජනනය කිරීමට

19. මදුරුවාගේ ජීවන චක්‍රයේ අවස්ථා හතර මෙහි දැක්වේ. මෙම අවස්ථා හතරෙන් පලගැටියාගේ ජීවන චක්‍රයේ දැකිය නොහැකි අවස්ථා වන්නේ,



(1) සුහුඹුලා හා පිලවා ය.
(2) ශිශුවා හා පිලවා ය.
(3) කීටයා හා පිලවා ය.
(4) කීටයා හා ශිශුවා ය.

20. රූපාන්තරණයක් **නොපෙන්වන්නේ,**
(1) සමනළයා ය. (2) කැරපොත්තා ය. (3) ගෙම්බා ය. (4) බල්ලා ය.

21. පලිබෝධ පාලනය සඳහා පරිසර හිතකාමී **නොවන** ක්‍රමයකි.
(1) ජෛව පාලනය (2) රසායනික පාලනය (3) සාම්ප්‍රදායික ක්‍රම (4) යාන්ත්‍රික ක්‍රම

22. පසට එකතුවන කාබනික ද්‍රව්‍ය ජීර්ණයට බලපෑමක් **නොමැති** සාධකය වන්නේ,
(1) උෂ්ණත්වයයි. (2) තෙතමනයයි. (3) **ක්ෂුද්‍ර ජීවීන් ය.** (4) වැලි ය.

23. නයිට්‍රජන් වායුව තිර කළ හැකි මූල ගැටිති දරන රනිල කුලයේ ශාකයකි.
(1) මෑ (2) පොල් (3) අඹ (4) කොස්

24. මැටි පසේ ලක්ෂණයක් නොවන්නේ,
(1) ශාක පෝෂක අඩු ය. (2) ජලය රඳවා ගැනීම අඩු ය.
(3) ක්ෂුද්‍ර ජීවීන් සංඛ්‍යාව අඩු ය. (4) වාතය රඳවා ගැනීම අඩු ය.

25. ඕසෝන් වියන ආරක්ෂා කර ගැනීම උදෙසා රටවල් අතර එකඟතාවයෙන් පිහිටුවා ගෙන ඇති ජාත්‍යන්තර සංවිධානය කුමක් ද?

(1) රැම්සාර් සම්මුතිය (2) මොන්ට්රියල් කෙටුම්පත

(3) වියානා සම්මුතිය (4) කියෝතෝ ප්‍රඥප්තිය

26. හරිතාගාර ආවරණය සඳහා ප්‍රධාන වශයෙන් හේතුවන වායුව,

(1) කාබන්ඩයොක්සයිඩ් ය (2) මෙතේන් ය

(3) ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් ය (4) නයිට්‍රජන්වල ඔක්සයිඩ ය

27. ලෝක ජනගහන වර්ධනය ඉහළ යාමට බලපෑමක් නොමැති කරුණකි.

(1) වෛද්‍ය ක්ෂේත්‍රයේ දියුණුව (2) තාක්ෂණික දියුණුව

(3) කෘෂිකර්මාන්තයේ දියුණුව (4) පරිගණක භාවිතයේ දියුණුව

28. අම්ල වැසි ඇතිවීමට බලපාන වායුව කුමක් ද?

(1) නයිට්‍රජන්ඩයොක්සයිඩ් (2) ඔක්සිජන්

(3) හයිඩ්‍රජන් (4) කාබන්ඩයොක්සයිඩ්

29. ජලය අණුවක් සෑදීමට සහභාගි වන මූලද්‍රව්‍ය දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

(1) ඔක්සිජන් පරමාණු එකක් සහ හයිඩ්‍රජන් පරමාණු එකක් එකතුවීමෙනි.

(2) ඔක්සිජන් පරමාණු එකක් සහ හයිඩ්‍රජන් පරමාණු දෙකක් එකතුවීමෙනි.

(3) ඔක්සිජන් පරමාණු දෙකක් සහ හයිඩ්‍රජන් පරමාණු එකක් එකතුවීමෙනි.

(4) ඔක්සිජන් පරමාණු දෙකක් සහ හයිඩ්‍රජන් පරමාණු දෙකක් එකතුවීමෙනි.

30. පහත මූලද්‍රව්‍ය අතරින් **ඝන ලෝහ** පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

(1) සෝඩියම්, කැල්සියම්, කාබන් (2) සෝඩියම්, සල්ෆර්, යකඩ

(3) මැග්නීසියම්, කැල්සියම්, සෝඩියම් (4) යකඩ, කාබන්, මැග්නීසියම්

31. පදාර්ථය භෞතික වශයෙන් විපර්යාසයකට ලක්වුනු අවස්ථාවක් නොවන්නේ,

(1) කඩදාසියක් ඇවිලීම. (2) ජලය වාෂ්පවීම.

(3) ජලය අයිස් බවට පත්වීම. (4) අයිස් කැටයක් දියවීම.

32. වායු පදාර්ථය **නොපෙන්වන** ලක්ෂණයකි,

(1) නිශ්චිත පරිමාවක් නැත. (2) පහසුවෙන් සම්පීඩනය කළ හැකි වීම.

(3) නිශ්චිත හැඩයක් දැරීම. (4) අඩු ඝනත්වයක් තිබීම.

33. ද්‍රව අවස්ථාවේ පවතින අලෝහමය මූලද්‍රව්‍යය වන්නේ,

(1) ක්ලෝරීන් ය. (2) බ්‍රෝමීන් ය. (3) අයඩීන් ය. (4) ආගන් ය.

*මූල ද්‍රව්‍ය කිහිපයක භාවිත අවස්ථා පහත දැක්වේ. 33, 34 හා 35 ප්‍රශ්න එම තොරතුරු පදනම ලෙස ගෙන පිළිතුරු සපයන්න.

A මූලද්‍රව්‍යය යූරියා පොහොර, පුපුරණ ද්‍රව්‍ය සෑදීමට භාවිත කරයි.

B මූලද්‍රව්‍යය කහ පාට කැට හා කුඩු ලෙස ඇත. ඖෂධ හා දිලීර නාශක සෑදීමට ගනී.

C මූලද්‍රව්‍යය මිශ්‍ර ලෝහයක් වන පිත්තල සෑදීමට, විදුලිය ගමන් කරන කම්බි නිපදවීමට

34. A මූලද්‍රව්‍යය බවට ඔබ නිගමනය කරන්නේ,
(1) කාබන් ය. (2) පොස්පරස් ය. (3) ක්ලෝරීන් ය. (4) නයිට්‍රජන් ය.

35. B මූලද්‍රව්‍යය බවට ඔබ නිගමනය කරන්නේ,
(1) ඔක්සිජන් ය. (2) සල්ෆර් ය. (3) හයිඩ්‍රජන් ය. (4) ක්ලෝරීන් ය.

36. C මූලද්‍රව්‍යය බවට ඔබ නිගමනය කරන්නේ,
(1) ඊයම් (2) ඇලුමිනියම් (3) තඹ (4) සින්ක්

37. මාධ්‍යයක් රහිතව තාපය එක් තැනක සිට තවත් තැනකට ගමන් කිරීම හඳුන්ව**න්නේ,**
(1) පරිවහනය නමිනි. (2) සන්නයනය නමිනි. (3) විකිරණය නමිනි. (4) සංවහනය නමිනි

38. රයිසෝමය නම් භූගත කඳක් දරණ ශාකයකි,
(1) ඉඟුරු (2) කතුරුමුරුංගා (3) ඉරිඟු (4) පොල්

39. කෘත්‍රිම වර්ධක ප්‍රජනන ක්‍රමයක් නොවන්නේ පහත කවරක් ද?,
(1) අතු කැබලි සිටුවීම (2) අතු බැඳීම (3) පටක රෝපණය (4) බද්ධ කිරීම

40. ලිංගික ප්‍රජනන ක්‍රමයට අනුව නව පැළ ඇති කිරීම දැක්වෙන වගන්තිය තෝරන්න.
(1) නව පැළ ඇතිවීම පත්‍රවලින් සිදු වේ. (2) නව පැළ ඇතිවීම බීජවලින් සිදු වේ.
(3) නව පැළ ඇතිවීම මුල්වලින් සිදු වේ. (4) නව පැළ ඇතිවීම භූගත කඳෙන් සිදු වේ.

[සියලුම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍ය වාර පරීක්ෂණය - 2023
இரண்டாம் தவணைப் பரீட்சை - 2023
Mid Year Term Test - 2023

සාමාන්‍ය විද්‍යාව - I,II විභාග අංකය : .... 3 ශ්‍රේණිය

සාමාන්‍ය විද්‍යාව - II

<u>සැලකිය යුතුයි,</u>

- **මෙම ප්‍රශ්න පත්‍රය I,II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය. උපරිම ලකුණු 120 ක් හිමිවේ.**
- **I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. (A), (B), (C) හා (D) කොටස් හතරට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතු ය.**
- **II කොටසින් ප්‍රශ්න 04කට ඔබ විසින් සපයාගත් කඩදාසි භාවිත කර පිළිතුරු සැපයිය යුතු ය.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 05 කි.**

<u>I කොටස</u>

01. A) පහත රූපයේ කොඳුඇට පෙළක් නැති ගැඩවිලෙකු (A) හා කොඳුඇට පෙළක් ඇති මිනිසෙකු (B) දැක්වේ.



i. කොඳුඇට පෙළක් නැති A කොඳුඇට පෙළක් ඇති B වර්ග කළ හැකි කාණ්ඩ මොනවා ද?
A... B...(ලකුණු 02+02)

ii. ගැඩවිලා අයත්වන සත්ව වංශය කුමක් ද?
....(ලකුණු 02)

iii. මිනිසා අයත්වන සත්ව කාණ්ඩය දක්වන්න.
.... (ලකුණු 02)

iv. සත්ව ලෝකයේ වංශ අතරින් වැඩිම සත්ව විශේෂ සංඛ්‍යාවක් අයත්වන වංශයේ නම සඳහන් කරන්න. .... (ලකුණු 02)

B) වසරේ එක්තරා මාස දෙකක රාත්‍රී 8 ට පමණ අහසේ දැකිය හැකි ප්‍රධාන තරු රටා කිහිපයක් පහත රූපයේ දැක්වේ.



i. A, B, C හා D තරු රටා හඳුනාගෙන නම් කරන්න.

A ....

B......................................

C......................................

D......................................

(ලකුණු 04)

ii. වසරේ කිනම් මාස දෙකක ඉහත තරු රටා අහසේ දැකිය හැකි වේ ද?

....

....

(ලකුණු 01+01)

iii. රාත්‍රී අහසේ දීප්තිත්ම තරුව කුමක් ද? එය කවර තරු රටාව තුළ පිහිටා තිබේ ද?

.... (ලකුණු 02+02)

C) හරිත ශාක දහවලේ දී අප සැමට වැදගත් වන ක්‍රියාවක් සිදුකරයි. එම ක්‍රියාවට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගන්නා ආකාරය දැක්වෙන රූපයක් මෙහි වේ.



i. රූපයේ දැක්වෙන මෙම ක්‍රියාව කුමක් ද?

.... (ලකුණු 02)

ii. ඔබ සඳහන් කළ ක්‍රියාවට යොදා ගැනෙන ශක්ති ආකාරය නම් කරන්න.

.... (ලකුණු 02)

iii. එම ශක්තිය සපයන ප්‍රභවය කුමක් ද?

.... (ලකුණු 02)

iv. හරිත ශාක සිදුකරන මෙම ක්‍රියාව අප සැමට වැදගත් වන්නේ කෙසේ ද?

....

.... (ලකුණු 04)

D) පදාර්ථයේ භෞතික අවස්ථා තුන හා ඒවායේ අංශු සැකැස්ම පහත දැක්වේ.

i. පදාර්ථය සෑදී ඇති අංශු, එනම් පදාර්ථයේ තැනුම් ඒකක හැඳින්වෙන්නේ කෙසේ ද?

.... (ලකුණු 02)

ii. නිශ්චිත/ස්ථිර හැඩයක් ඇති පදාර්ථ වර්ගය කුමක් ද?

.... (ලකුණු 02)

iii. ඉහත පරීක්ෂණ නලයට නයිට්‍රජන්ඩයොක්සයිඩ් වායුව පුරවා ඇත්නම් එහි වර්ණය සඳහන් කරන්න.

.... (ලකුණු 02)

iv. පරීක්ෂණ නලය පුරා නයිට්‍රජන්ඩයොක්සයිඩ් වායුව පැතිර තිබෙනු පෙනෙන නිසා වායු පදාර්ථය සතු ලක්ෂණයක් ලියන්න.

.... (ලකුණු 04)

<u>II කොටස</u>

02. පහත ප්‍රශ්නවල හිස්තැනට වරහන තුළ දී ඇති වචනවලින් වඩාත්ම ගැළපෙන හා සුදුසුම වචනය තෝරා පිළිතුර ලෙස දක්වන්න.

(බැක්ටීරියා, මුහුදුමල, පසැගිල්ලා, මෝරා, කැරපොත්තා, මාකැන්ටියා, පොල්, මඬු, නයා, කොස්)

i. බීජ හටගන්නා අපුෂ්ප ශාකය ....

ii. බීජ හටනොගන්නා අපුෂ්ප ශාකය ....

iii. පුෂ්ප හටගන්නා ඒකබීජපත්‍රී ශාකය ....

iv. මුදවපු කිරි (මී කිරි) නිෂ්පාදනයට .... උපකාරවෙයි.

v. දේහ බිත්තිය සෛල ස්තර දෙකකින් සෑදී ඇති සත්වයා ....

vi. පංච අරීය දේහ සමමිතියක් දරන සත්වයා ....

vii. පුෂ්ප හටගන්නා ද්වීබීජපත්‍රී ශාකය ....

viii. දේහය අනාකූල හැඩයක් ගන්නා සත්වයා ....

ix. කොරළ සහිත ග්‍රන්ථිවලින් තොර වියළි සමක් දරන සත්වයා ....

x. ඛන්ඩික දේහය හිස, උරස හා උදරය ලෙස බෙදී ඇත.

(ලකුණු 02x10)

03. පහත ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද, වැරදි නම් (x) ලකුණ ද පිළිතුර ලෙස දක්වන්න.

i. සූර්යයා ආසන්නයේ පිහිටි බුධ, සිකුරු, පෘථිවිය, සහ අඟහරු වැනි බරින් වැඩි ඝන ග්‍රහලෝක නිර්මාණය වී තිබේ.

ii. සූර්යයා අසල පිහිටි බුධ, සිකුරු ග්‍රහලෝකවල උෂ්ණත්වය අඩු ය.
iii. සූර්යයාට ඈතින් පිහිටි යුරේනස් , නෙප්චූන් ග්‍රහලෝකවල උෂ්ණත්වය වැඩි ය.
iv. පෘථිවියේ භ්‍රමණ කාලය පැය 23 විනාඩි 56 කි. පරිභ්‍රමණ කාලය දින 365 පැය 6 කි.
v. චන්ද්‍රයාගේ භ්‍රමණ කාලය දින 27 කි. පරිභ්‍රමණ කාලය දින 365 කි.
vi. බුධ හා සිකුරු ග්‍රහයන්ට උපග්‍රහයන්/පරිවාර ග්‍රහයන් ඇත.
vii. සෞරග්‍රහ මණ්ඩලයට අයත් ග්‍රහ වස්තුවල භ්‍රමණය සූර්ය කේන්ද්‍රීය ආකෘතියෙන් මුලින් ම ප්‍රකාශ කළේ සැමෝස් ඇරිස්ටාකස් විසිනි.
viii. සෞරග්‍රහ මණ්ඩලය අයත් වන මන්දාකිණිය/චක්‍රාවාටය ක්ෂීරපථය නමින් හැඳින්වේ.
ix. පෘථිවියට උපග්‍රහයන්/පරිවාර ග්‍රහයන් නොමැත.
x. රාශි චක්‍රයට අයත් තරු රටා සංඛ්‍යාව 12 කි. (ලකුණු 02x10)

04. පහත වගන්ති වලට වරහන තුළ දී ඇති ගැළපෙන වචන උපුටා දක්වමින් පිළිතුරු සපයන්න.

(පයිතගරස් , ඇරිස්ටෝටල්, ඔක්සිජන්, කාබන්ඩයොක්සයිඩ්, ජලය, උෂ්ණත්වය, ආලෝකය, සිකුරු, සෙනසුරු, උල්කාපාත)

i. මිනිසා ඇතුළුව සෑම සතෙක් ම හුස්ම ගැනීමේ දී ලබාගනී.
ii. භූ කේන්ද්‍රීය ආකෘතිය ඉදිරිපත් කළේ ය.
iii. හරිත ශාක දහවලේ දී ආහාර නිපදවා ගැනීමට පත්‍ර මඟින් ලබාගනී.
iv. පෘථිවිය ගෝලාකාර බව පළමුව ප්‍රකාශ කරන ලදී.
v. ශාකවලට ප්‍රමාණාත්මකව ලබාගත නොහැකි විට මැලවේ.
vi. දැවෙමින් පොළොව දෙසට අහසේ සිට ඇදී එන කුඩා ග්‍රාහක කැබලි මේ නමින් හඳුන්වයි.
vii. මෙහි ඉහළයාම නිසා මී හරකුන් මඩේ ලැග සිටීමට ප්‍රිය කරයි.
viii. මෙම ග්‍රහයා වටා උප ග්‍රහයන් නොවේ.
ix. මෙම ග්‍රහයා වටා දූවිලිවලින් සෑදුනු වළලු පද්ධතියක් තිබේ.
x. තණ බිස්සක් ලැලි කැල්ලකින් දින කිහිපයක් වසා තැබූ විට කොළ පැහැය නැතිවීමට හේතු වේ. (ලකුණු 02x10)

05. පහත A තීරුවේ ප්‍රකාශ 10 ක් දැක්වේ. B තීරුවේ එම ප්‍රකාශ 10 ට ගැළපෙන පිළිතුරු 10 ක් වේ. A තීරුවේ එක් එක් ප්‍රකාශයට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරන්න. එහි ඉංග්‍රීසි අක්ෂරය හෝ වචනය ඔබේ පිළිතුර ලෙස දක්වන්න.

	A තීරුව	B තීරුව
i.	ජීවන චක්‍රයේ දී බිත්තර, කීටයා, පිලවා, හා සුහුඹුලා ලෙස අවස්ථා 4 කි.	a. කැරපොත්තා
ii.	ජීවන චක්‍රයේ දී බිත්තර, ශිශුවා, සුහුඹුලා, ලෙස අවස්ථා 3 ක් වේ.	b. සමනළයා
iii.	ඩෙංගු රෝගයේ රෝග වාහකයා ලෙස ක්‍රියාකරයි.	c. නයා
iv.	පරිසරයේ ජීවත්වන කිසියම් විශේෂයකට අයත් තනි ජීවියෙකු මෙලෙස හඳුන්වයි.	d. මදුරුවා
v.	2016 වර්ෂයේ දී හෝර්ටන්තැන්නේ ජීවත් වූ ගෝනුන් සමූහය	e. ඒකෙකයා
vi.	දිවියා මුවෙකු ගොදුරු කර ගැනීම.	f. සහභෝජිත්වය
vii.	කිනිතුල්ලන් ගවයෙකුගේ සිරුරෙන් රුධිරය උරාබීම.	g. ගහනය
viii.	ධාරක ශාකය ලෙස බෝ ශාකයක් මත අපිශාක පවතී. මෙම සම්බන්ධතාවය හඳුන්වන නම.	h. විලෝපීයතාවය
ix.	පළමු පෝෂී මට්ටම නියෝජනය කරන නිෂ්පාදකයෙකි.	i. පරපෝෂිතාවය
x.	තෙවන හෝ සිව්වන පෝෂී මට්ටම නියෝජනය කරන මාංශභක්ෂකයෙකි.	j. කොස් ගස

(ලකුණු 02x10)

06. A. මූලද්‍රව්‍යවල විවිධ ගුණ ඇත. එම ගුණ අනුව මූලද්‍රව්‍ය භාවිත අවස්ථා ද විවිධ වේ. පහත මූලද්‍රව්‍ය හා මූලද්‍රව්‍යවල භාවිත අවස්ථා දැක්වේ. මූලද්‍රව්‍යවල භාවිත අවස්ථාවලට ගැළපෙන මූලද්‍රව්‍යය පිළිතුර ලෙස දක්වන්න.

මූලද්‍රව්‍ය - ඔක්සිජන් , කාබන් , යකඩ , සල්ෆර් , ඇලුමිනියම් , නයිට්‍රජන්, තඹ

මූලද්‍රව්‍යවල භාවිත අවස්ථා

i. පාලම්, රේල්පීලි, ආයුධ, සෑදීමට යොදාගනී.
ii. ස්වභාවිකව හමුවන මිනිරන් හා දියමන්ති සෑදී තිබෙන මේ මූලද්‍රව්‍යය වියළි කෝෂවල ඉලෙක්ට්‍රෝඩ හා ස්නේහක ලෙස ද භාවිතා කරයි.
iii. ආහාර පිසීමට හා බීම ඇසිරිමට ගන්නා බඳුන්, මාර්ගවල විදුලි රැහැන් ඇදීමට යොදාගනී.
iv. ලෝහ පෑස්සීමට, අභ්‍යවකාශගාමීන්, කිමිදුම්කරුවන් හා කඳු නගින්නන්ට අවශ්‍ය වේ.
v. ගිනිකූරු, රතිඤ්ඤා, වෙඩි බෙහෙත්, ඖෂධ වර්ග හා සල්ෆියුරික් අම්ලය සෑදීමට භාවිතා කරයි.

(ලකුණු 02x05)

B. තාපය සංක්‍රාමණය යනු තාපය එක් තැනක සිට තවත් තැනකට ගමන් කිරීමයි. පහත A රූපයෙන් වාතය තුළ තාපය සංක්‍රාමණය වන අවස්ථාවක් (ගිනි ගෙඩක් /ගිනි මැලයක්) හා B රූපයෙන් වාතය තුළ තාපය සංක්‍රාමණය වන අවස්ථාවක් දැක්වේ.



A



B

i. A හා B රූපවලින් දැක්වෙන තාපය සංක්‍රාමණය වන ක්‍රමය කුමක් ද?
ii. යකඩ වැනි ඝන ද්‍රව්‍ය රත්කිරීමේ දී තාපය සංක්‍රාමණය වන ක්‍රමය හඳුන්වන නම කුමක් ද?
iii. තාපය සංක්‍රාමණය නොකරන හෝ එම හැකියාව අඩු ඝන ද්‍රව්‍යයකට උදාහරණයක් ලියන්න.
iv. ගිනි ගොඩ /ගිනි මැලය අසල (තරමක් ඈත්ව) සිටින විට අප ශරීරය වෙත උණුසුම දැනීමට තාපය සංක්‍රාමණය වන ක්‍රමය හඳුන්වන්නේ කෙසේ ද?
v. කළු හා සුදු තීන්ත ආලේප කළ එක සමාන වීදුරු බෝතල් දෙකක් හිරු එළිය වැටෙන තැනක තබනු ලැබේ. යම් වේලාවකට පසුව එම ස්ථානයෙන් ඉවත්කර ඉක්මනින් සිසිල් වන්නේ කවර බෝතලය දැයි පරීක්ෂා කළේ නම්, ඔබ බලාපොරොත්තු වන පිළිතුර දක්වන්න.

(ලකුණු 02x05)

07. ශාකවල ලිංගික ප්‍රජනන ක්‍රියාවලිය ගැන විස්තරයක් පහත දැක්වේ. එහි අංක සහිතව හිස්තැන් 10 ක් වේ. එම හිස්තැන්වලට පිළිතුරු ලෙස යොදාගත හැකි වචන 10 ක් පහත වරහන තුළ දී ඇත. හිස්තැන් සඳහා සුදුසු පිළිතුරු හිස්තැනේ අංකයට අනුව දක්වන්න.

(**කීලය, කලංකය, පුෂ්පය, සූත්‍රිකාව, පරාග, පරිනත පරාග, පරාගනය, පරපරාගනය, ඩිම්භ, ඩිම්භකෝෂය**)

ශාකවල ලිංගික ප්‍රජනනය සඳහා 1)................. නමැති විශේෂ ප්‍රරෝහය නිපදවයි. එහි ලිංගික ප්‍රජනනය සඳහා අවශ්‍ය ප්‍රජනක සෛල (ජන්මාණු) නිපදවීම මූලික කාර්යය වේ.

පුෂ්පයක පුරුෂ ප්‍රජනක සෛල හෙවත් පුං ජන්මාණු නිපදවීමට ජායාංගය (ස්ත්‍රී කොටස) ක්‍රියා කරයි. පුමාංගයට (රේණුවට) 2) .... හා පරාගධානිය අයත් වේ. පරාගධානිය තුළ පුං ප්‍රජනක සෛල (පුං ජන්මාණු) නියෝජනය කරන 3) .... නිපදවයි.

පුෂ්පයක ජායා ප්‍රජනක සෛල හෙවත් ජායා ජන්මාණු නිපදවීමට ජායාංගය (ස්ත්‍රී කොටස) ක්‍රියා කරයි. ජායාංගයට (ස්ත්‍රී කොටසට) කලංකය 4) .... හා 5) .... අයත් වේ. ඩිම්භකෝෂය තුළ ජායා ප්‍රජනක සෛල (ජායා ජන්මාණු) වන 6) .... නිපදවයි.

පුෂ්පයක පරාගධානිය තුළ නිපදවන 7) .... එම විශේෂයේ ම පුෂ්පයක 8) .... මත තැන්පත්වීම 9) .... නම් වේ. පරාගනය සිදුවන ආකාර දෙකකි. ස්ව පරාගනය හා 10) .... එම ආකාර දෙකයි.

(ලකුණු 02x10)

සාමාන්‍ය විද්‍යාව

අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 3 ශ්‍රේණිය



මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2018

Primary Piriven Year End Tearm Test - 2018

03 ශ්‍රේණිය/Grade **03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සාමාන්‍ය විද්‍යාව I, II
Genaral Science I, II

කාලය : පැය තුන යි
Time : Three Hours

සාමාන්‍ය විද්‍යාව I

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 80ක් හිමිවේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01. නිවැරදි සංවිධාන රටාව ඇතුලත් පිළිතුර තෝරන්න.

i. සෛලය ⟶ ඉන්ද්‍රිය ⟶ පටකය ⟶ පද්ධති ⟶ ජීවියා
ii. සෛලය ⟶ පටකය ⟶ ඉන්ද්‍රිය ⟶ පද්ධති ⟶ ජීවියා
iii. සෛලය ⟶ පටකය ⟶ පද්ධති ⟶ ඉන්ද්‍රිය ⟶ ජීවියා
iv. සෛලය ⟶ පද්ධති ⟶ පටකය ⟶ ඉන්ද්‍රිය ⟶ ජීවියා

02. බීජ හටනොගන්නා අපුෂ්ප ශාකයකට උදාහරණයක් වන්නේ.

i. මඬු ය. ii. පයිනස් ය. iii. වද ය. iv. ගිනිහොට ය.

03. ඒක බීජ පත්‍රී ශාකයක ලක්ෂණයක් වනුයේ,

i. කඳ අතු බෙදීම යි.
ii. බීජයේ බීජ පත්‍ර දෙකක් ඇරීම යි.
iii. පත්‍ර සමාන්තර නාරටි වින්‍යාශයක් ඇරීම යි.
iv. මුදුන් මුලක් සහ පාර්ශ්වික මුල් ඇරීම යි.

04. ද්වි පුස්ථර ජීවියා සඳහන් පිළිතුර තෝරන්න.

i. සමනලයා ii. ගොලුබෙල්ලා iii. කුඩැල්ලා iv. මුහුදු මල

05. දේහය අනාකූල හැඩයක් ගන්නා ප්‍රධාන කාණ්ඩ දෙක අඩංගු පිළිතුර තෝරන්න.

i. මැමේලියා , පිස්කේස්
ii. ඇම්ෆිබියා , ආවේස්
iii. පිස්කේස් , ආවේස්
iv. රෙප්ටීලියා , ඇම්ෆිබියා

06. සෞරග්‍රහ මණ්ඩලයට අයත් කුඩාම හා විශාල ම ග්‍රහයන් අනුපිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

i. බුධ , බ්‍රහස්පති

ii. සිකුරු , පෘථිවි

iii. සෙනසුරු , බ්‍රහස්පති

iv. නෙප්චූන් , අඟහරු

07. සූර්ය කේන්ද්‍රිය ආකෘතිය මුලින් ම ප්‍රකාශ කළ තාරකා විද්‍යාඥයා ලෙස පිළිගෙන ඇත්තේ,

i. පයිතගරස් ය. ii. ඇරිස්ටාකස් ය. iii. ඇරිස්ටෝටල් ය. iv. ටොලමි ය.

08. රාත්‍රී අහසේ දීප්තිමත් ම තරුව වන ''සීරියස්'' දැකිය හැක්කේ මින් කුමන තරු රටාව තුළ ද?

i. මිථුන ii. මහවලසා iii. මහබල්ලා iv. සිංහ රාශිය

09. රාත්‍රී අහස නිරීක්ෂණය කිරීමේ දී මුළු අහස ම දර්ශනය වන ස්ථානයක දැකිය හැකි උපරිම රාශි සංඛ්‍යාව,

i. 4 කි. ii. 6 කි. iii. 8 කි. iv. 12 කි.

10. සූර්යයා පිළිබඳ වගන්ති කිහිපයක් පහත දැක්වේ.

(a) පෘථිවිය මත සිටින සියළු ජීවීන්ට අවශ්‍ය තාප හා ආලෝක ශක්තිය ලබාදෙයි.

(b) පෘථිවි ග්‍රහයාගේ සියළු දේශගුණික රටා පාලනය කරයි.

(c) සූර්යාගේ මතු පිට උෂ්ණත්වය සෙල්සියස් අංශක 5778 කි.

මින් නිවැරදි වගන්ති වන්නේ,

i. a හා c ය. ii. a හා b ය. iii. b හා c ය. iv. a, b, c සියල්ලම ය.

11. පූර්ණ රූපාන්තරණයක් පෙන්වන සත්ත්වයෙකු වන්නේ.

i. කැරපොත්තා ය. ii. පළගැටියා ය. iii. ගෙමැස්සා ය. iv. ගෙම්බා ය.

12. ජෛව පාලන ක්‍රමයේ **අවාසියක්** සඳහන් වරණය තෝරන්න.

i. පරිසර හානිය අවම වීම.

ii. ප්‍රතිඵල ලබාදීමට දිගු කලක් ගත වීම.

iii. වියදම අඩු වීම.

iv. දීර්ඝ කාලීන ප්‍රතිඵල ලබා දීම.

13. යාන්ත්‍රික පලිබෝධ පාලන ක්‍රමයක් සඳහන් වන නිදසුන තෝරන්න.

i. ආලෝකය යොදාගෙන සතුන් ආකර්ෂණය කර විනාශ කිරීම

ii. බෝගවලට පලිබෝධනාශක ඉසීම

iii. කීටයන් වෙසෙන ස්ථානවලට රසායනික ද්‍රව්‍ය යෙදීම

iv. ජලය මතුපිට පාවෙන තෙල්වර්ග යෙදීම

14. ඒකෛකයා යන සංවිධාන මට්ටමට ගැලපෙන උදාහරණය තෝරන්න.

i. ගෙවත්තක් ii. අඹ ශාකයක් iii. තේක්ක වගාවක් iv. මුව රංචුවක්

15. ''2016 වර්ෂයේ සිංහ රාජයේ ජීවත් වූ අලි'' යන මෙම ප්‍රකාශනයෙන් අර්ථවත් වන සංවිධාන මට්ටම තෝරන්න.

i. ප්‍රජාව ii. පරිසර පද්ධතිය iii. ජෛව ගෝලය iv. ගහනය

16. විලෝපීයතාව යන අන්තර්ක්‍රියාව සඳහා උදාහරණයක් වන්නේ,

i. කිනිතුල්ලකු ගවයෙකුගේ රුධිරය උරාබීම ය.

ii. දිවියා හාවෙකු ගොදුරු කර ගැනීම ය.

iii. පිල්ල ශාකය ධාරක ශාකයෙන් ජලය හා පෝෂණය ලබා ගැනීම ය.

iv. කොකු පණුවා මිනිසාගේ ආහාර මාර්ගයේ ජීවත්වෙමින් රුධිරය උරාබීම ය.

17. රූපයේ දැක්වෙන ක්‍රියාවලිය සඳහා ගැලපෙන A, B, C හා D අවස්ථා පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?



i. ඛනිජ ලවන, ආලෝක ශක්තිය, කාබන්ඩයොක්සයිඩ්, ජලය

ii. ජලය, කාබන්ඩයොක්සයිඩ්, ආලෝක ශක්තිය, ඔක්සිජන්

iii. ජලය, ආලෝක ශක්තිය, කාබන්ඩයොක්සයිඩ්, ඔක්සිජන්

iv. ජලය, ඔක්සිජන්, ආලෝක ශක්තිය, කාබන්ඩයොක්සයිඩ්

18. මඳ ආලෝකය ප්‍රියකරන ශාකය කුමක් ද?

i. බඩ ඉරිඟු ii. තක්කාලි iii. මිරිස් iv. උඩවැඩියා

19. වී ශාකය ⟶ ගොයම් මැස්සා ⟶ ගෙම්බා ⟶ ඇටිකුකුළා ⟶ උකුස්සා

ඉහත ආහාර දාමයේ තුන්වන යැපෙන්නා වනුයේ,

i. උකුස්සා ය. ii. ඇටිකුකුළා ය. iii. ගෙම්බා ය. iv. ගොයම් මැස්සා ය.

20. නිවර්තන වැසිවනාන්තරයක් සඳහා නිවැරදි උදාහරණය වන්නේ කුමක් ද?

i. නකල්ස් රක්ෂිතය ii. සිංහරාජය iii. මුතුරාජවෙල iv. ශ්‍රීපාද රක්ෂිතය

21. පසේ ඇති නයිට්‍රජනීය සංයෝග සාන්ද්‍රනය අඩු වනුයේ පහත කුමන අවස්ථාවේ දී ද?

i. ජෛවීය තිරකරණය ii. නයිට්‍රීහරණය

iii. වායුගෝලීය තිරකිරීම iv. කාර්මික තිරකරණය

22. මිනිස් ගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීමට හේතුවක් **නොවන්නේ** කුමක් ද?

i. තාක්ෂණික දියුණුව ii. වෛද්‍ය ක්ෂේත්‍රයේ දියුණුව

iii. ආහාර නිෂ්පාදනය ඉහළ යාම iv. මරණ අනුපාතිකය ඉහළ යාම

23. පහත දැක්වෙන්නේ පදාර්ථය පිළිබඳ ලක්ෂණ කිහිපයකි.

(a) නිශ්චිත හැඩයක් ඇත. (b) පහසුවෙන් සම්පීඩනයට ලක්කළ හැකයි.

(c) ඉහළ ඝනත්වයක් පවතී. (d) නිශ්චිත පරිමාවක් නැත.

වායුවක් දක්වන ලක්ෂණ සඳහන් ප්‍රකාශය වන්නේ,

i. a හා b ය. ii. b හා c ය. iii. b හා d ය. iv. c හා d ය.

24. රබර්වල ශක්තිමත් බව වැඩිකර ගැනීමට (වල්කනයිස් කිරීමට) රබර් සමග මිශ්‍ර කරනු ලබන මූලද්‍රව්‍යය කුමක් ද?

i. Al ii. Mg iii. S iv. Na

25. 

ඉහත රූප සටහන්වල දැක්වෙන්නේ විවිධ ද්‍රව කිහිපයක ගිල්වා ඇති ද්‍රවමාන කිහිපයකි.

ඝනත්වය අඩුම ද්‍රව්‍ය හා ඝනත්වය වැඩිම ද්‍රව්‍ය වනුයේ අනුපිළිවෙළින්,

i. B හා A ය. ii. A හා C ය. iii. B හා C ය. iv. B හා A ය.

26. සූර්යාලෝකයෙන් ලැබෙන විකිරණ තාපය පරාවර්තනය සිදුකරගත හැකි අවස්ථාවක් ඇති පිළිතුර කුමක් ද?

i. ලිප මත තබන බඳුන් කළු පැහැති වීම

ii. ශීත රටවල වැසියන් අඳුරු පැහැති ඇඳුම් ඇඳීම

iii. තද සූර්යාලෝකයේ දී කළු පැහැති කුඩයක් භාවිත කිරීම

iv. ක්‍රිකට් ක්‍රීඩකයින් දහවල් කාලයේ දී සුදු පැහැති ඇඳුම් භාවිතය

27. 10 kg ස්කන්ධයක් සහිත ද්‍රව්‍යයක පරිමාව $2m^3$ කි. එම ද්‍රව්‍යයේ ඝනත්වය සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද?

i. 20 kg m^{-3} ii. 1/2 kg m^{-3} iii. 5 kg m^{-3} iv. 12 kg m^{-3}

28. ලෝහවලින් සැකසූ හැඳි ප්ලාස්ටික් හෝ ලී මිටකින් නිමවා ඇත. එමගින් කුමන තාප සංක්‍රමණ ක්‍රමය වළක්වා ගෙන ඇත්ද?

i. සංවහනය ii. සන්නයනය iii. විකිරණ iv. පරාවර්තනය

29. ධාවක කඳන් මගින් වර්ධක ප්‍රජනනය සිදු කරන ලබන්නේ පහත කුමන ශාකය ද?

i. කරපිංචා ii. බිගෝනියා iii. ගොටුකොළ iv. හබරල

30. පුෂ්පය ලපටි අවධියේ දී ආරක්ෂා කිරීම සිදු කරනු ලබන්නේ කුමක් මගින් ද?

i. මනිපත්‍ර ii. වෘන්තය iii. දලපත්‍ර iv. පුමාංගය

31. සුළඟ මගින් බීජ ව්‍යාප්තිය සිදු කරන ශාකවලට නිවැරදි උදාහරණ දැක්වෙන වරණය කුමක් ද?

i. කජු , පොල් , නෙළුම් ii. හොර , ඕකිඩ් , තුත්තිරි

iii. ගම්මාලු , මුරුංගා , වරා iv. ඇපල , නාගදරණ , කදුරු

32. බීජ ප්‍රරෝහණය සඳහා අවශ්‍ය **නොවන** සාධකය කුමක් ද?

i. බීජයේ ජීව්‍යතාව　　ii. තෙතමනය

iii. ඔක්සිජන්　　iv. ආලෝකය

33. ගංවතුර ඇතිවීමට පසුබිම් වන දිගුකාලීන විද්‍යාත්මක සාධකය මින් කුමක් ද?

i. නොකඩවා කෙටි කාලයක් තුළ පවත්නා වර්ෂාව

ii. අක්‍රමවත් ලෙස පහත් බිම් ගොඩ කිරීම

iii. 100 mm වඩා වැඩි වර්ෂාව

iv. සතුන්ගේ අස්වාභාවික හැසිරීම් රටා

34.

මෙම අකුණු මිනිසා හරහා භූගත වන්නේ කුමන අනතුරක් ලෙස ද,

i. සෘජු

ii. පාර්ශ්වික

iii. පියවර

iv. ස්පර්ශ

35. ශ්‍රී ලංකාවේ නියඟය බහුල ව පවතින ප්‍රදේශය කුමක් ද?

i. හම්බන්තොට　　ii. කුරුණෑගල

iii. බදුල්ල　　iv. ගාල්ල

36. සුනාමි ඇතිවීමට වැඩිපුරම බලපාන්නේ භූතැටි ගැටීමෙන් ඇතිවන භූ කම්පනයි ශ්‍රී ලංකාව පිහිටා ඇති භූතැටිය මින් කුමක් ද?

i. දකුණු ඇමරිකා භූතැටිය　　ii. ආසියානු භූතැටිය

iii. ඉන්දු - ඕස්ට්‍රේලියානු භූතැටිය　　iv. පැසිපික් භූතැටිය

37. භූමි කම්පාවක ප්‍රභලත්වය මනින දර්ශකය වන්නේ,

i. බැරෝ මීටරය යි.　　ii. කැතෝඩ කිරණ දෝලනේක්ෂය යි.

iii. සෝනාර් උපකරණය යි.　　iv. රිච්ටර් මාපකය යි.

38. ශ්‍රී ලංකාවේ සුලභ ව නායයාම් ඇතිවන දිස්ත්‍රික්කයකි,

i. අනුරාධපුරය.　　ii. බදුල්ල.　　iii. ගම්පහ.　　iv. මාතර.

39. චන්ද්‍ර මණ්ඩලය පැහැදිලිව අහසේ දැකිය හැකි වීමෙන් හඳුනාගත හැකි පරිසර වෙනස්වීම වන්නේ,

i. නායයාම යි.　　ii. සුනාමි රළ යි.　　iii. ගංවතුර යි.　　iv. නියඟය යි.

40. නිරිත දිග මෝසම් සුළං ඇතිවන කාලය නිවැරදි ව දැක්වෙන් පිළිතුර තෝරන්න.

i. නොවැම්බර් සිට පෙබරවාරි දක්වා

ii. මැයි සිට සැප්තැම්බර් දක්වා

iii. අප්‍රේල් මස තුළ

iv. ඔක්තෝබර් මස තුළ

මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2018

Primary Piriven Year End Tearm Test - 2018

03 ශ්‍රේණිය / Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සාමාන්‍ය විද්‍යාව I, II
Genaral Science I, II

සාමාන්‍ය විද්‍යාව II

සැලකිය යුතුයි :

i. මෙම ප්‍රශ්න පත්‍රය I,II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
ii. I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (A) (B) (C) සහ (D) කොටස් හතරට ම පිළිතුරු සැපයිය යුතු ය.
iii. II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
iv. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි. මෙම කොටසට ලකුණු 120 ක් හිමි වේ.

I කොටස

01) (A) ඉහත රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i. අපෘෂ්ඨවංශී සතුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. පෘෂ්ඨවංශී සතුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

iii. මාළුවා අයත් කාණ්ඩයට පොදු වූ ලක්ෂණ දෙකක් හඳුන්වන්න. (ලකුණු 02)

iv. මෙහි සඳහන් නොවන අපෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

v. සමනලයාගේ ජීවන චක්‍රයේ රූපීය අවස්ථා හතර සඳහන් කරන්න. (ලකුණු 02)

(B)

i. ක්ෂුද්‍ර ජීවීන් යනු කවරහු ද? (ලකුණු 02)

ii. බැක්ටීරියාවලින් මිනිසා ලබාගන්නා ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

iii. යීස්ට් අයත් වන ක්ෂුද්‍රජීව කාණ්ඩය හඳුන්වන්න. (ලකුණු 02)

iv. වෛරස් සතු එකම ජීව ලක්ෂණය කුමක් ද? (ලකුණු 02)

v. කෙසෙල් වඳ පීදිම, ජලභීතිකාව වැනි රෝග ඇති කරන ක්ෂුද්‍ර ජීව කාණ්ඩය නම් කරන්න. (ලකුණු 02)

(C)



ඉහත රූපයේ දක්වා ඇත්තේ චන්ද්‍රග්‍රහණයක් ඇති වන අවස්ථාවක ග්‍රහ පිහිටීම යි.

i. a, b, c නම් කරන්න. (ලකුණු 03)

ii. චන්ද්‍රග්‍රහණයක් ඇති වන්නේ කෙබඳු දිනක දී ද? (ලකුණු 02)

iii. b හා c ස්ථාන මාරු කළ විට ඇති වන සංසිද්ධිය නම් කරන්න. (ලකුණු 01)

iv. එම සංසිද්ධිය පියවි ඇසින් නිරීක්ෂණය නොකරන්නේ ඇයි? (ලකුණු 02)

v. සූර්යාගේ ලප ඇති බව මුලින් ම නිරීක්ෂණය කළ විද්‍යාඥයා කවුද?. (ලකුණු 02)

(D)

i. ජෛව පාලන ක්‍රමයේ ඇති වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. රසායනික පාලන ක්‍රමයේ ඇති අවාසිදායක තත්ත්ව දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

iii. පහත අස්ථාවලදී වායුගෝලයට එකතු වන වායු දූෂක නම් කරන්න.

(a) තීන්ත නිෂ්පාදනයේ දී ....

(b) ගිනි කඳු පිපිරීමේ දී .... (ලකුණු 02)

iv. ගෝලීය උණුසුම ඉහළයාමෙන් ඇති වන අහිත කර තත්ත්ව දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

v. අභය භූමි හා උද්භිද උද්‍යානවල භාවිත කරන ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රම පිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 02)

II කොටස

02).

i. ස්වාභාවික පරිසරයේ සිදුවන ජෛව අන්තර්ක්‍රියා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

ii. පුරුක් තුනක ආහාර දාමයක් ලියා දක්වන්න. (ලකුණු 03)

iii. වනාන්තර ඉවත් කිරීම නිසා ඇතිවිය හැකි අහිතකර තත්ත්ව දෙකක් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 04)

iv. වාරි කෘෂිකර්මාන්තයේ යහපත් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

v. පාංශු දූෂණය සිදුකරන නොදිරන ද්‍රව්‍ය තුනක් නම් කරන්න. (ලකුණු 03)

vi. හරිතාගාර වායු සඳහා උදාහරණ දෙකක් සපයන්න. (ලකුණු 02)

03).

i. අංශු සැකැස්ම අනුව a, b, හා c පදාර්ථ පෙන්වන භෞතික අවස්ථා නම් කරන්න. (ලකුණු 04)

a  b  c 

a

ii. පදාර්ථයේ තැනුම් ඒකකය සඳහන් කර එහි පවතින උපපරමාණුක අංශු වර්ග නම් කරන්න. (ලකුණු 04)

iii. වගුවේ හිස්තැන් පුරවන්න.

මූලද්‍රව්‍ය	සංකේතය	භෞතික අවස්ථාව
යකඩ (අයන්)		
නයිට්‍රජන්		
මැග්නිසියම්		
හයිඩ්‍රජන්		

(ලකුණු 04)

iv. පහත වාක්‍ය නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද ඉදිරියෙන් යොදන්න.

(i) කිසියම් ද්‍රවයක ඝනත්වයට වඩා ඝනත්වයෙන් වැඩි වස්තු එම ද්‍රවයේ ගිලේ. (.............)

(ii) ද්‍රව්‍යයක් ජලයේ දිය කරමින් ද්‍රාවණයක් පිළියෙළ කිරීමේ දී එම ද්‍රාවණයේ ඝනත්වය ක්‍රමයෙන් අඩු වේ. (.............)

(iii) ජලයේ පොල්තෙල් ද භූමිතෙල් ද පාවේ. (.............)

(iv) මිනිරන් තුළින් විද්‍යුතය සන්නයනය නොකරයි. (.............)

(ලකුණු 04)

v. විදුරු භාජනයකට ප්‍රවේශමෙන් විවිධ ද්‍රව කිහිපයක් එක්කළ පසුව දක්නට ලැබෙන ආකාරය රූපයේ දැක්වේ.



ද්‍රව ලෙස භූමිතෙල්, ග්ලිසරින්, ජලය හා රසදිය යොදා ගෙන ඇත.
ඉහත ද්‍රව්‍ය අතරින් a,b, c හා d නම් කරන්න.

(ලකුණු 04)

04).

i. ශාක ප්‍රජනනය සිදු කරන ප්‍රධාන ආකාර දෙක හඳුන්වන්න.

(ලකුණු 04)

ii. භූගත කඳන් ප්‍රධාන වර්ග හතරකට බෙදනු ලැබේ. ඒ මොනවාද?. (ලකුණු 04)

iii. පහත දැක්වෙන්නේ බද්ධ ක්‍රම දෙකකි A හා B නම් කරන්න.



(ලකුණු 04)

iv. මෙම බද්ධ ක්‍රමය හඳුන්වන්න. (ලකුණු 04)

v. බද්ධ කළ ශාකවලින් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

05). පුෂ්පයක දික කඩක් රූපයේ දැක්වේ.



i. a, b, c හා d නම් කරන්න. (ලකුණු 04)

ii. පුමාංගයට අයත් වන කොටස් දෙක කුමක් ද? (ලකුණු 04)

iii. පර පරාගණයේ විශේෂ වාසියක් සඳහන් කරන්න. (ලකුණු 04)

iv. ස්ව පරාගණය වළක්වා ගැනීම සඳහා ශාක දක්වන අනුවර්තන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

v. පහත වගුව සම්පූර්ණ කරන්න.

ශාකය	පරාගණ කාරකය
දෙහි	
වී	
වැලිස්නේරියා	
ඉරිඟු	

(ලකුණු 04)

06). i. නායයෑම්වලට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

ii. නායයෑමක් සිදුවිය හැකි බව දැනගත හැකි පූර්ව පරිසර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. අකුණු ගැසීමක් ඇතිවන්නේ කෙසේ ද?. (ලකුණු 04)

iv. අකුණු සහිත කාලගුණයක් පවතින විට ආරක්ෂාව සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

v. සුනාමියක් පිළිබඳ අනතුරු ඇඟවීමක් සිදුකළ අවස්ථාවක දී ඔබ රැගෙන යන මෙවලම් මල්ලෙහි තිබිය යුතු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය හතරක් නම් කරන්න. (ලකුණු 04)

මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

Primary Piriven Year End Test - 2020

03 ශ්‍රේණිය/Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සාමාන්‍ය විද්‍යාව II
General Science II

කාලය : පැය තුන යි
Time : Three Hours

සාමාන්‍ය විද්‍යාව I

සැලකිය යුතු යි :

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමි වේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට අදාළ කවය තුළ (X) ලකුණ යොදන්න.
iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. ජීවීන් වර්ගීකරණය කළ මුල්ම විද්‍යාඥයා ලෙස හඳුන්වනු ලබන්නේ මින් කවුරුන් ද?

1. ජෝන් රේ
2. අර්නස්ට් හේකල්
3. ඇරිස්ටෝටල්
4. කැරොලස් ලිනේයාස්

02. ජීවීන්ගේ වර්ගීකරණ මට්ටම් නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.

1. රාජධානිය ⟶ වංශය ⟶ ගෝත්‍රය ⟶ වර්ගය ⟶ කුලය ⟶ ගණය ⟶ විශේෂය
2. රාජධානිය ⟶ වංශය ⟶ වර්ගය ⟶ ගෝත්‍රය ⟶ කුලය ⟶ ගණය ⟶ විශේෂය
3. රාජධානිය ⟶ වංශය ⟶ වර්ගය ⟶ කුලය ⟶ ගෝත්‍රය ⟶ ගණය ⟶ විශේෂය
4. රාජධානිය ⟶ වර්ගය ⟶ වංශය ⟶ ගෝත්‍රය ⟶ ගණය ⟶ කුලය ⟶ විශේෂය

03. ඒකබීජපත්‍රී ශාකයක ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?

1. සමාන්තර නාරටි වින්‍යාසයක් පැවතීම.
2. කඳ අතුවලට බෙදී තිබීම.
3. බීජයේ එක් බීජ පත්‍රයක් තිබීම.
4. තන්තු මූල පද්ධතියක් තිබීම.

04. පෘෂ්ඨවංශිකයෙක් වන්නේ මින් කුමන ජීවියා ද?

1. ගෙම්බා
2. ගැඩවිලා
3. මුහුදු ලිලී
4. මුහුදු මල

05. පහත සඳහන් ජීවීන්ගෙන් වෙනත් කාණ්ඩයකට අයත් ජීවියකු වන්නේ,

1. පසැගිල්ලා ය.
2. මුහුදු කටු ඉකිරියා ය.
3. මුහුදු ලිලී ය.
4. මුහුදු මල ය.

06. පහත ජීවීන් අතුරින් උභය ජීවියකු නොවන ජීවියා කවුද?

1. ගෙම්බා
2. මැස්සා
3. මැඩියා
4. සලමන්දරා

07. බැක්ටීරියා මගින් බෝවන රෝගයක් නොවන්නේ මින් කුමක් ද?

1. කොලරාව
2. කොවිඩ් 19
3. අතීසාරය
4. පෝලියෝ

08. මන්දාකිණියක හැඩයක් නොවන පිළිතුර කුමක් ද?

1. සර්පිලාකාර
2. ත්‍රිකෝණාකාර
3. ඉලිප්සාකාර
4. අසමමිතික

09. නැගෙනහිර සිතිජයෙන් තරු රටාවක් උදා වන කාල පරතරය අයත් පිළිතුර කුමක් ද?

1. පැය 1/2
2. පැය 1
3. පැය 2
4. පැය 3

10. වසරක් තුළදී අහස හරහා සූර්යයා ගමන් කරන්නාක් මෙන් පෙනෙන ගමන් මාර්ගය හඳුන්වනු ලබන නම කුමක් ද?

1. ක්‍රාන්තිවලය
2. ක්ෂිරපථය
3. රාශි චක්‍රය
4. මණ්දාකිණිය

11. අහසේ එක් රාශියකට අයත් අංශක ගණන පහත ඒවායින් තෝරන්න.

1. 15^0
2. 30^0
3. 45^0
4. 36^0

12. රතු ග්‍රහලෝකය ලෙස හඳුන්වනු ලබන්නේ මින් කුමන ග්‍රහයා ද?

1. බ්‍රහස්පති
2. සෙනසුරු
3. ප්ලූටෝ
4. අඟහරු

13. සමනලයාගේ ජීවන චක්‍රයේ අක්‍රීය අවධිය කුමක් ද?

1. බිත්තර
2. සුහුඹුලා
3. කීටයා
4. පිලවා

14. ජෛව පාලන ක්‍රමයේ අවාසිය මින් කුමක් ද?

1. පරිසරහානිය අවම වීම
2. වියදම අඩු වීම
3. ප්‍රතිඵල ලබා දීමට දිගුකාලයක් ගත වීම
4. දීර්ඝ කාලීන ප්‍රතිඵල ගෙන දීම

15. ගහනයකට උදාහරණයක් නොවන පිළිතුර තෝරන්න.

1. 2019 වර්ෂයේ ජාතික රෝහලෙන් අනාවරණය කර ගත් ඒඩ්ස් රෝගීන් ගණන.
2. 2018 වර්ෂයේ යාල වනයේ ජීවත් වූ අලි ගණන.
3. 2018 වර්ෂයේ සිංහරාජ වනයේ ජීවත් වූ වඳුරන් ගණන.
4. 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ජනගහනය.

16. අභ්‍යන්තර පරපෝෂිතයකු වන ජීවියා තෝරන්න.

1. කිනිතුල්ලා
2. උකුණා
3. වටපණුවා
4. මැක්කා

17. සහජීවන තත්ත්වයක් නොවන්නේ මින් කුමක් ද?

1. පරපෝෂි තාවය
2. සහභෝජිත්වය
3. ප්‍රාක් සහභාගිත්වය
4. අන්‍යෝන්‍ය සහජීවනය

18. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය සාධක කීපයක් පහත දැක්වේ.

A	හිරුඑළිය	B	හරිතප්‍රද
C	කාබන්ඩයොක්සයිඩ්	D	ඔක්සිජන්

ඒවායින් අභ්‍යන්තර සාධක පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1. A, B, C
2. A, B, D
3. B, C, D
4. A, C, D

19. මැටි පසෙහි ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?

1. මැටි ප්‍රමාණය සාපේක්ෂව වැඩි ය
2. වාතයේ රඳා පැවතීම අඩු ය
3. ක්ෂුද්‍ර ජීවීන්ගේ සංඛ්‍යාව අඩු ය
4. ශාක පෝෂක වැඩි ය

20. ජීවී ගහනයක වර්ධන චක්‍රයට අදාළ ප්‍රස්තාරය මින් කුමක් ද?

1. ජීවි ගහණය



කාලය

2. ජීවි ග්‍රහණය



කාලය

3. ජීවි ග්‍රහණය



කාලය

4. ජීවි ග්‍රහණය



කාලය

21. මිනිස් ගහනය ශීඝ්‍රයෙන් වර්ධනය වීමට වඩාත් හේතුවන පිළිතුර කුමක් ද?

1. මරණ අනුපාතය ඉහළ යාම
2. උපත් මරණ වැඩි වීම
3. වසංගත රෝග වැඩි වීම
4. මරණ අනුපාතය පහළ යාම

- පහත රූපවල ඇත්තේ ශාකවල භූගත කොටස් කීපයකි.

A



කැරට්

B

මඤ්ඤොක්කා

C



බතල

D

අර්තාපල්

22. මේවායින් භූගත කඳන් ලෙස සැලකෙන්නේ කුමක් ද?

1. A 2. B 3. C 4. D

23. රැම්සර් සම්මුතියට අනුව සංරක්ෂණයට ලක්කරන්නේ පහත ඒවායින් කුමක් ද?

1. අභයභූමි
2. සත්ත්ව උද්‍යාන
3. තෙත් බිම්
4. උද්භිද උද්‍යාන



24. මෙහි දැක්වෙන අංශු අනුව ඝන, ද්‍රව, වායු යන පදාර්ථ පිළිවෙළට ඇති පිළිතුර මින් කුමක් ද?

1. A, B, C
2. A, C, B
3. C, A, B
4. B, C, A

- පදාර්ථවල ලක්ෂණ කීපයක් පහත දැක්වේ.
  - A හොඳින් තාපය සන්නයනය කරයි
  - B ආවේණික දීප්තියක් ඇත
  - C දුර්වල විද්‍යුත් සන්නායකයක වේ
  - D තන්‍යතාව ඇත

25. ලෝහවලට අදාළ ලක්ෂණ පමණක් ඇති පිළිතුර තෝරන්න.

1. A, B, D
2. A, C, D
3. B, C, D
4. A, B, C

26. මෙම මූලද්‍රව්‍යවල සංකේත අනුපිළිවෙළට දක්වා ඇති පිළිතුර වන්නේ මින් කුමක් ද?

(සෝඩියම්, මැග්නීසියම්, කාබන්, සල්ෆර්)

1. Na, Mg, C, S
2. Mg, Na, S, C
3. C, Na, Mg, S
4. S, C, Mg, Na

27.



ද්‍රව්‍ය A ද්‍රව්‍ය B ද්‍රව්‍ය C

මෙම ද්‍රව්‍ය අතුරින් ඝනත්වයන් ආරෝහණය වන ආකාරයට සැකසූ පිළිතුර කුමක් ද?

1. A, B, C
2. A, C, B
3. B, A, C
4. C, A, B

28. ජලය 5000kg වල පරිමාව $5m^3$ නම්ජලයේ ඝනත්වයට අදාළ නිවැරදි අගය වන්නේ,

1. 900 kgm^{-3}
2. 1000 kgm^{-3}
3. 5000 kgm^{-3}
4. 5 kgm^{-3}

29. ඝනත්වයේ විවිධත්වය යොදා ගන්නා අවස්ථාවක් නොවන පිළිතුර මින් කුමක් ද?

1. ඉල්ලම් පස්වලින් මැණික් වෙන් කර ගැනීම
2. සහල්වලින් ගල් වැලි වෙන් කර ගැනීම
3. මුහුදු වතුරෙන් ලුණු වෙන් කර ගැනීම
4. පොල් කිරිවලින් පොල් තෙල් වෙන් කර ගැනීම

30. තාප සංක්‍රමණ ක්‍රමයක් නොවන පිළිතුර මින් කුමක් ද?

1. සන්නයනය
2. සංවහනය
3. විකිරණය
4. වාෂ්පීභවනය

31. තාප අවශෝෂක හා විමෝචක ශීඝ්‍රතාව වැඩි ම පෘෂ්ඨය මින් කුමක් ද?

1. නිල්
2. සුදු
3. දිළිසෙන
4. කළු

32. ශාක වර්ධක ක්‍රම කීපයක් පහත දැක්වේ.

A	මුල් මගින්	B	බීජ මගින්
C	භූගත කඳන්	D	පත්‍ර මගින්

වර්ධක ප්‍රජනන ක්‍රම පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

1. A, B
2. A, C
3. B, C
4. C, D

33. බද්ධ කළ නොහැකි ශාකයක් වන්නේ මින් කුමක් ද?

1. ගොයම්
2. අඹ
3. වම්බටු
4. දෙහි

34. බීජ ප්‍රරෝහණයට අවශ්‍ය අභ්‍යන්තර සාධකය මින් කුමක් ද?

1. ජලය
2. වාතය
3. ජීව්‍යතාව
4. උෂ්ණත්වය

35. A නයිට්‍රජන්
B ඇලුමිනියම්
C රසදිය

ඝණ, ද්‍රව හා වායු අවස්ථාවේ පවතින පිළිතුර මින් කුමක් ද?

1. A, B, C
2. A, C, B
3. B, A, C
4. B, C, A

36. අකුණුවලින් වැළකීමට අනුගමනය කළ යුතු ක්‍රියාවක් නොවන්නේ මින් කුමක් ද?

1. රැහැන් සහිත දුරකථන භාවිත නොකිරීම
2. එළිමහනේ වැඩ කිරීම
3. විද්‍යුත් උපකරණ ක්‍රියාවිරහිත කර තැබීම
4. බිම නිදාගැනීමෙන් වැළකීම

37. දිගුකාලීන නියං ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

1. විශාල වැව් සිඳීම
2. මාසික වර්ෂාපතනය 50mm ට වඩා අඩු වීම
3. ජලශවල ජලමට්ටම ක්‍රමයෙන් පහළ බැසීම
4. කෙටි කාලීන බෝග මිය යාම

38. ශ්‍රී ලංකාව අයත් භූ තැටිය වන්නේ මින් කුමක් ද?

1. පැසිෆික් භූ තැටිය
2. උතුරු ඇමරිකානු භූ තැටිය
3. ඉන්දු ඕස්ට්‍රේලියා භූ තැටිය
4. ආසියානු භූ තැටිය

39. ස්වාභාවික විපතක් නොවන පිළිතුර මින් කුමක් ද?

1. කැලෑ ගිනි තැබීම
2. ලැව් ගිනි හට ගැනීම
3. නායයාම
4. සුනාමිය

40. Covid 19 රෝග වාහකයා හා රෝග කාරකයා අනු පිළිවෙළින් ඇති පිළිතුර මින් කුමක් ද?

1. බල්ලා . බැක්ටීරියා
2. බල්ලා . වෛරස
3. මිනිසා . බැක්ටීරියා
4. මිනිසා . වෛරස

මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

Primary Piriven Year End Test - 2020

03 ශ්‍රේණිය/Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සාමාන්‍ය විද්‍යාව I, II
General Science I, II

සාමාන්‍ය විද්‍යාව II

සැලකිය යුතු යි :

i. A කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද B කොටසේ ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

A කොටස

01. (අ) පහත රූපය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i. ග්‍රහවස්තුවල භ්‍රමණය හා පරිභ්‍රමණය හඳුන්වන්න.

ii. විශාලතම ග්‍රහ වස්තුව කුමක් ද?

iii. වැඩිම උපග්‍රහයන් සිටින ග්‍රහ වස්තුව කුමක් ද?

iv. ජීවය පවතින ග්‍රහයා කුමක් ද?

v දූවිලි වලාවකින් වට වී ඇති ග්‍රහයා කුමක් ද?

(ලකුණු $2 \times 5 = 10$)

(ආ)

i. පූර්ණ රූපාන්තරණය පෙන්වන සතෙකු ලියන්න.

ii. පළිබෝධකයින් පාලන ක්‍රම දෙකක් ලියන්න.

iii ඒකෙකයෙකු ලියා දක්වන්න.

iv අභ්‍යන්තර පරපෝෂිතයකු නම් කරන්න.

v ඕසෝන් වියන විනාශ වීමෙන් ඇති වන අහිතකර ප්‍රතිඵලයක් ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

(ඉ)

i. පදාර්ථයේ මූලික ආකාර තුන නම් කරන්න.

ii. ලෝහමය මූල ද්‍රව්‍ය තුනක් ලියන්න.

iii ද්‍රව අවස්ථාවේ පවතින ලෝහය කුමක් ද?

iv සණ ප්‍රසාරණය භාවිතයෙන් නිපදවා ඇති උපකරණයක් ලියන්න..

v තාප සංක්‍රමණය වන ආකාර දෙකක් ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

(ඊ)

i. ශාකවල ප්‍රජනන ආකාර දෙක මොනවා ද?

ii. භූගත කඳන්වල ආකාර දෙකක් ලියන්න.

iii සුළඟ මගින් පරාගනය වන පුෂ්ප දෙකක් ලියන්න.

iv ස්වපරාගනය වැළැක්වීමට පුෂ්ප දක්වන අනුවර්තන දෙකක් ලියන්න.

v පුෂ්පයක පූමාංගයට අයත් කොටස් දෙක මොනවා ද?

(ලකුණු 2 × 5 = 10)

B කොටස

02

i ජීවීන් වර්ගීකරණ ගැලීම් සටහන සම්පූර්ණ කරන්න.

රාජධානිය → .... → වර්ගය → ගෝත්‍රය → ....

← ගණය

(ලකුණු 6 යි)

ii ප්‍රධාන ශාක වර්ග දෙක නම් කරන්න. (ලකුණු 2 යි)

iii අපෘෂ්ඨවංශීන් වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 2 යි)

iv එකයිනොඩර්මේටාවන්ගේ ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 4 යි)

v බැක්ටීරියාවන්ගේ ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 4 යි)

vi වෛරස් වල විශේෂ ලක්ෂණයක් ලියන්න. (ලකුණු 2 යි)

03

i ස්වාභාවික පරිසරයේ සිදු වන ජෛව අන්තර් ක්‍රියා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4 යි)

ii පුරුක් හතරක ආහාර දාමයක් ලියන්න. (ලකුණු 4 යි)

iii වනාන්තර විනාශ කිරීමෙන් ඇති විය හැකි අහිතකර තත්ත්ව දෙකක් විස්තර කරන්න. (ලකුණු 4 යි)

iv. පාංශු දූෂණය සිදු කරන නොදිරන ද්‍රව්‍ය දෙකක් ලියන්න. (ලකුණු 2 යි)

v හරිතාගාර වායු දෙකක් ලියන්න. (ලකුණු 2 යි)

vi වාරි කෘෂි කර්මාන්තයේ යහපත් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4 යි)

04 ලොව සෑදී ඇත්තේ පදාර්ථ හා ශක්තීන්වලිනි.

i වායුමය හා ඝන පදාර්ථවල ප්‍රතිවිරුද්ධ ලක්ෂණ දෙක බැගින් ලියන්න. (ලකුණු 2 යි)

ii පදාර්ථයේ මූලික තැනුම් ඒකකය කුමක් ද? (ලකුණු 2 යි)

iii මූලද්‍රව්‍ය හතරක් සඳහන් කර ඒවායේ සංකේත ලියන්න. (ලකුණු 4 යි)

iv. ලෝහවල ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 4 යි)

v ඝන හා ද්‍රවවල ප්‍රසාරණය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා දෙකක් සඳහන් කර ඒවා විස්තර කරන්න. (ලකුණු 4 යි)

vi වනය තුළින් සංවහනය සිදු වන බව පෙන්වීමට පරීක්ෂණයක් විස්තර කරන්න. (ලකුණු 4 යි)

05 ජීවීන්ට තම වර්ගයා නොනැසී පවත්වා ගැනීමට ප්‍රජනනය අත්‍යවශ්‍ය සාධකයකි. සපුෂ්පික ශාකවල ප්‍රජනනය සිදු කරන ව්‍යූහය පුෂ්පය යි.



i මෙහි සඳහන් පුෂ්ප වර්ගය නම් කර එහි A - G දක්වා කොටස් හඳුන්වන්න. (ලකුණු 6 යි)

ii සංසේචනය යන්න හඳුන්වන්න. (ලකුණු 4 යි)

iii බීජ ප්‍රරෝහණ ආකාර දෙක ලියන්න. (ලකුණු 2 යි)

iv. ඵල හා බීජ වල ව්‍යාප්තිය සිදුවන ආකාර හතරක් දක්වන්න. (ලකුණු 4 යි)

v බීජ ප්‍රරෝහණයට අවශ්‍ය සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 2 යි)

vi බද්ධයක් සඳහා යොදාගන්නා ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 2 යි)

06 ආපදා යනු මිනිස් සමාජය වර්තමානයේ මුහුණ දෙන ප්‍රබල අභියෝගයකි.

i අධික වැසි සමයේ දී ඇති විය හැකි ස්වාභාවික ආපදා හතරක් නම් කරන්න. (ලකුණු 4 යි)

ii අකුණු වර්ග තුන නම් කර හඳුන්වන්න. (ලකුණු 3 යි)

iii අකුණු පහරකට ලක් වූ අයෙකුට ලබා දිය හැකි ප්‍රථමාධාර හතරක් ලියන්න. (ලකුණු 4 යි)

iv. නියඟය පිළිබඳ ව දැන ගත හැකි පරිසර වෙනස් වීම් දෙකක් ලියන්න. (ලකුණු 2 යි)

v සුනාමි තත්වයක් ඇති වීමට බලපෑ හැකි ප්‍රධාන සාධක තුනක් ලියන්න. (ලකුණු 3 යි)

vi සුනාමියකට මුහුණ දීමේ දී ඔබ කළ යුතු පියවර හතරක් ලියන්න. (ලකුණු 4 යි)

සියලුම හිමිකම් ඇවිරිණි]
Kg[g; gjpg;g$upika$ilaJ]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන ශාඛාව -
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)
Mz;oWjpg; guPl;ir - 2021 (2022)
Year End Term Test – 2021 (2022)

පැය තුනයි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.

සාමාන්‍ය විද්‍යාව - I, II **3 ශ්‍රේණිය**

සාමාන්‍ය විද්‍යාව - I

සැලකිය යුතුයි :

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 80ක් හිමි වේ. (2 × 40 = 80)**
- **අංක 01 සිට 40 තෙක් ඇති ප්‍රශ්නවල , දී ඇති (1) , (2) , (3) , (4) යන වරණ අතරින් නිවැරදි හෝ වඩාත් යෝග්‍ය වරණය තෝරා ඔබට ලැබී ඇති පිළිතුරු පත්‍රයේ අදාල කවය තුළ (×) ලකුණ යොදන්න.**

01. ජීවීන් වර්ගීකරණයේ දී ප්‍රධාන ජීවී කාණ්ඩයක් **නොවන්නේ**,
(1) කෘමීන් (2) ශාක (3) සතුන් (4) ක්ෂුද්‍ර ජීවීන්

02. සත්ව වර්ගීකරණය සඳහා මූලික නිර්ණායකයක් ලෙස සලකනු ලබන්නේ,
(1) ශරීරය කොටස්වලට බෙදා දැක්විය හැකි වීම / නොහැකි වීම.
(2) පෘෂ්ඨ රජ්ජුවක් (කශේරුව) දැරීම / නොදැරීම
(3) දේහ බිත්තියේ සෛල ස්ථර සංඛ්‍යාව දෙකකි. / තුනකි.
(4) දේහ සමමිතිය දැරීම / නොදැරීම.

03. ● බීජයක බීජ පත්‍ර දෙකකි.
● පත්‍රයක ජලාභ නාරටි වින්‍යාසයකි.
මෙම ලක්ෂණ සහිත ශාකයක් වන්නේ,
(1) මිරිස් (2) වී (3) පොල් (4) බඩඉරිඟු

04. ජීවී මෙන්ම අජීවී ලක්ෂණ පෙන්වන කාණ්ඩයකි.
(1) බැක්ටීරියා (2) වෛරස (3) දිලීර (4) ප්‍රොටොසෝවා

05. ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂයෙන් පමණක් දැක ගත හැකි වන්නේ,
(1) ඇල්ගී (2) දිලීර (3) වෛරස (4) බැක්ටීරියා

06. විශ්වය පිළිබඳව **වැරදි** පිළිතුර තෝරන්න.
(1) විශ්වය යනු පවතින හැම දෙයක්ම යන්නයි.
(2) විශ්වයට මන්දාකිනි, තාරකා, කළු කුහර හා ග්‍රහලෝක අයත් ය.
(3) විශ්වයට ජීවීන් හැර අන් සියල්ල අයත් ය.
(4) විශ්වය දිනෙන් දින ප්‍රසාරණය වේ.

07. සෞරග්‍රහ මණ්ඩලයට අයත් සමාජිකයෙකුට අයත් **නොවන්නේ**,
(1) ප්ලූටෝ (2) නෙප්චූන් (3) යුරේනස් (4) සෙනසුරු

08. සෞරග්‍රහ මණ්ඩලයේ කුඩාම ග්‍රහ ලෝකය
(1) සිකුරු (2) පෘථිවිය (3) අඟහරු (4) බුධ

09. ● පෘථිවිය පැතලි වස්තුවකි.
- එය නැවක් මෙන් මුහුදේ පා වෙමින් පවතී.
- සූර්යයා, චන්ද්‍රයා හා තාරකා පෘථිවිය වටා ගමන් කරන ගිනි බෝල වේ.

ඉහත අදහස් ප්‍රකාශ කළේ,

(1) තෙලස් (2) පයිතගරස් (3) ඇරිස්ටෝටල් (4) සැමෝස් ඇරිස්ටාකස්

10. සෞරග්‍රහ මණ්ඩලය ආශ්‍රිත සංසිද්ධි තුනක් පහත දැක්වේ.

(a) සූර්ය ග්‍රහණයක් සිදු වන්නේ අමාවක දිනක ය.

(b) චන්ද්‍ර ග්‍රහණයක් සිදු වන්නේ පසළොස්වක දිනක ය.

(c) සූර්ය ග්‍රහණ පියෙවි ඇසින් නිරීක්ෂණය නොකළ යුතුයි.

මේවායින් සත්‍ය වනුයේ,

(1) a හා b (2) b හා c (3) a හා c (4) a ,b හා c

11. වසරේ පෙබරවාරි, මාර්තු හා මැයි, ජූනි මාසවල රාත්‍රී අහසේ දැකිය හැකි තරු රටාව කුමක් ද?

(1) ඔරායන් (දඩයක්කාරයා) (2) මහ වළසා (3) මහ බල්ලා (4) වෘෂභ

12. පෘථිවියේ සිට අහස දෙස බලන විට පෙනෙන දෘෂ්‍ය ගෝලය හැඳින්වෙන්නේ,

(1) රාශි චක්‍රය ලෙසිනි. (2) ඛගෝලය ලෙසිනි.

(3) සමකය ලෙසිනි. (4) ක්‍රාන්ති වලය ලෙසිනි.

13. ජීවී මෙන්ම අජීවී පරිසරය සමතුලිතව පවත්වා ගනිමින් නිරතුරුව පරිසරයේ වෙනස් වීම් සිදු වීම හඳුන්වන්නේ,

(1) පරිසරයේ ගතික ස්වභාවය (2) පරිසරය සංරක්ෂණය

(3) පරිසරයේ සිදු වන අන්තර් ක්‍රියා (4) පරිසරයේ ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය

14. රූපාන්තරණයක් පෙන්වන්නේ,

(1) වඳුරා (2) ගිරවා (3) මඳුරුවා (4) ඔටුවා

15. පරිසරයේ ජීවත් වන ''අලියා'' යන සත්වයින් විස්තර කර හැකි ජෛව ගෝලයේ සංවිධාන මට්ටම කුමක් ද?

(1) ඒකෙකයා (2) ගහනය (3) විශේෂය (4) ප්‍රජාව

16. කිනිතුල්ලෙකු ගවයෙකුගේ ශරීරය මත වෙසෙමින් රුධිරය උරා බොමින් ජීවත් වීම.

(1) තරගය යි. (2) පරපෝෂිතාවය යි.

(3) විලෝපීයතාවය යි. (4) සහජීවනය යි.

17. පරිසර පද්ධතියක ජීවීන් හා ජීවී නොවන සාධක / අජෛව සාධක අතර අන්තර් ක්‍රියාවකට නිදසුනකි.

(1) නිදිකුම්බා ශාකයක මූල ගැටිත්තක් තුළ බැක්ටීරියාවක් ජීවත් වීම.

(2) විශාල ශාකයක අතු මත ඕකිඩ් වැනි අපිශාක වර්ධනය වීම.

(3) පිළිල ශාකයක් අඹ අත්තක කෙළවරක වර්ධනය වීම.

(4) ප්‍රභාසංශ්ලේෂණයට සූර්ය ශක්තිය ලබා ගැනීම.

18. සූර්යයාගෙන් ලැබෙන ශක්තිය පෝෂි මට්ටම් තුලින් ගලා යාමේ දී එක් පෝෂී මට්ටමකින් ඊලග පෝෂී මට්ටමට ගලා යන ශක්තියෙන් ජීවියා තුල තිර කෙරෙන ශක්ති ප්‍රමාණය වන්නේ,

(1) 10% (2) 20% (3) 30% (4) 40%

19. වායුගෝලීය නයිට්‍රජන් තිර කිරීමට උපකාරී වන ශාකයක් වන්නේ,
(1) පොල් (2) අඹ (3) ඕලූ (4) මෑ

20. ඕසෝන් වියන ආරක්ෂා කර ගැනීම උදෙසා රටවල් අතර එකඟතාවයෙන් පිහිටුවා ගෙන ඇති ජාත්‍යන්තර සංවිධානය කුමක් ද?
(1) රැම්සාර් සම්මුතිය (2) මොන්ට්‍රියල් කෙටුම්පත
(3) වියානා සම්මුතිය (4) කියෝතෝ ප්‍රඥප්තිය

21. පදාර්ථය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
(a) අවකාශයේ ඉඩක් ගන්නා ස්කන්ධයක් සහිත ද්‍රව්‍ය පදාර්ථ වේ.
(b) භෞතික වශයෙන් පදාර්ථ ත්‍රිවිධාකාරයි.
(c) පදාර්ථ සෑදී ඇති අංශු සංයෝග නම් වේ.
මේවායින් සත්‍ය ප්‍රකාශ වන්නේ,
(1) a හා c (2) b හා c
(3) a හා b (4) a ,b හා c

22. ස්වභාවිකව ද්‍රව අවස්ථාවේ පවතින මූලද්‍රව්‍යයකි.
(1) ක්ලෝරීන් (2) ම'කරි (රසදිය) (3) අයඩීන් (4) කැල්සියම්

23. ඝනත්වය සම්බන්ධයෙන් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) ඝනත්වය මනින ජාත්‍යන්තර සම්මත ඒකකය ඝන මීටරයට කිලෝ ග්‍රෑම් ය. (Kgm^{-3})
(2) යම් ද්‍රව්‍යයක ඒකක පරිමාවක ස්කන්ධය එම ද්‍රව්‍යයේ ඝනත්වය යි.
(3) යම් ද්‍රව්‍යයක ඝනත්වය එම ද්‍රව්‍යයට අනන්‍ය වන ගුණයක් නොවේ.
(4) භූමිතෙල් ජලය මත පාවෙන්නේ ජලයට වඩා ඝනත්වය අඩු නිසා ය.

24. ද්‍රව හා වායු තුළ තාපය සංක්‍රාමණය වන ක්‍රමය කුමක් ද?
(1) සන්නයනය (2) පරාවර්තනය (3) විකිරණය (4) සංවහනය

25. කෘත්‍රිම වර්ධක ප්‍රචාරණ / ප්‍රජනන ක්‍රමයක් නොවන්නේ,
(1) අතු බැඳීම (2) භූගත කඳන් පැලවීම
(3) බද්ධ කිරීම (4) පටක රෝපනය

26. නොගැලපෙන වරණය තෝරන්න.

	පුෂ්පයේ කොටස	**කාර්යය**
(1)	පුෂ්ප වෘන්තය / නටුව	පුෂ්පය ශාකයට සම්බන්ධව තබා ගැනීම.
(2)	මනිපත්‍ර	ලපටි අවස්ථාවේ දී පුෂ්පයට ආරක්ෂාව සැලසීම.
(3)	දලපත්‍ර / මුකුටය	සුවඳ පැතිරවීම.
(4)	පුමාංගය / රේණුව	පුං ප්‍රජනක සෛල ලෙස පරාග නිපදවීම.

27. සතුන් මගින් පරාගනය සිදු වීමට හැඩගැසුනු පුෂ්පයකි.
(1) කතුරුමුරුංගා (2) වී (3) පොල් (4) ඉරිඟු

28. වීදුරු කැපීමට දියමන්ති තුඩක් සහිත උපකරණයක් භාවිතා කරන්නේ දියමන්ති සතු කවර ගුණයක් නිසා ද?
(1) භංගුරතාවය (2) දෘඪතාවය (3) තන්‍යතාවය (4) ආඝාතවර්ධ්‍යතාවය

29. හිරු රශ්මිය අධික දිනවල දී සුදු ඇඳුම් ඇඳීම වඩාත් වැදගත් වන්නේ,
(1) ආලෝකය උරා ගැනීම අඩු කර ගැනීමට
(2) දේහය උණුසුම් වීම අඩුකර ගැනීමට
(3) ආලෝකය පරාවර්තනය වීම වැඩිකර ගැනීමට
(4) දේහය උණුසුම් වීම වැඩිකර ගැනීමට

30. **වැරදි** සම්බන්ධයක් සහිත පිළිතුර තෝරන්න.

(1) ලූණු - මොටියන් (2) කහ - රෙරෙසෝමය
(3) අර්තාපල් - ස්කන්ධාකන්දය (4) හබරල - කෝමය

31. ආවේණික දිස්නයක් තිබීම.

(1) සෑම අලෝහයකම ලක්ෂණයකි. (2) ඇතැම් ලෝහවල ලක්ෂණයකි.
(3) සෑම ලෝහයකම ලක්ෂණයකි. (4) ලෝහ අලෝහ දෙවර්ගයේ ම ලක්ෂණයකි.

32. ප්‍රසාරණය භාවිත **නොවන** උපකරණයකි.

(1) උෂ්ණත්වමානය (2) විදුලි ස්ත්‍රික්කය
(3) ගිනි සංඥා උපකරණය (4) සූත්‍රිකා පහන / විදුලි බල්බය

33. භූමි කම්පාවක ප්‍රබලත්වය මනින දර්ශකය වන්නේ,

(1) පැස්කල් (2) බාර් (3) රිච්ටර් (4) නිව්ටන්

34. ගං වතුරකින් පසු පැතිර යා හැකි බෝවන රෝගයකි.

(1) හෘදයාබාධ (2) අළුහම් (3) ජලභීතිකාව (4) පාචනය

35. නායයාමේ අවදානමක් කල්තියා හඳුනා ගැනීමට වැදගත් වන ලක්ෂණයක් නොවන්නේ,

(1) ගෘහාශ්‍රිත සතුන්ගේ හා පක්ෂීන්ගේ අස්වාභාවික හැසිරීම් රටා
(2) දින ගණනාවක් තිස්සේ හිරු එළිය නොලැබීම.
(3) දින ගණනාවක් තිස්සේ ඇද හැලෙන අධික වර්ෂාව
(4) නිවසේ බිත්ති හෝ පොළොවේ ඇති වන ගැඹුරු ඉරි තැලීම්.

36. ගොඩනැගිල්ලක් අල්ලා ගෙන සිටින මිනිසෙකුට හානි කරවන අකුණු වර්ගයකි.

(1) ඍජු අකුණු (2) වලා අකුණු (3) ස්පර්ශ අකුණු (4) වා අකුණු

37. දිගු කාලීන වියළි කාලගුණයක් සහිත නියගයක් ඇති වෙටෙක නිරීක්ෂණය කළ නොහැකි තත්වයකි.

(1) ජලාශ / වැව් සිඳී යාම (2) පොළොව ඉරි තැලීම
(3) ඉඳහිට වර්ෂාව ඇද හැලීම (4) පරිසර උෂ්ණත්වය ඉහළ යාම.

38. ශ්‍රී ලංකාවේ සුලබ ව නායයෑම් වාර්තාවන දිස්ත්‍රික්කයකි.

(1) හම්බන්තොට (2) මහනුවර (3) අනුරාධපුරය (4) කුරුණෑගල

39. නියගය හා ගංවතුර බහුලව වාර්තාවන දිස්ත්‍රික්ක දෙක වන්නේ,

(1) හම්බන්තොට , රත්නපුරය (2) කුරුණෑගල , කෑගල්ල
(3) අනුරාධපුරය , මහනුවර (4) පොලොන්නරුව , කළුතර

40. සුනාමි ඇති වීමට හේතුවක් වශයෙන් සැලකිය නොහැක්කේ,

(1) මුහුදු පතුලේ ගිනි කඳු පිපිරීම.
(2) භූ තැටි ගැටීමෙන් ඇති වන භූ කම්පන
(3) මුහුදේ ගමන් කරන නැව් එකිනෙක ගැටීම.
(4) මුහුදු පතුලේ නායයෑම් සිදු වීම.

සියලුම හිමිකම් ඇවිරිණි]
Kg[g; gjpg;g$upika$ilaJ]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை

State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)

Mz;oWjpg; guPl;ir - 2021 (2022)

Year End Term Test – 2021 (2022)

සාමාන්‍ය විද්‍යාව - I, II **3 ශ්‍රේණිය**

සාමාන්‍ය විද්‍යාව - II

සැලකිය යුතුයි :

- **මෙම ප්‍රශ්න පත්‍රය I , II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.**
- **I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ), (ඇ) හා (ඉ) කොටස් හතරට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය.**
- **II කොටසින් ප්‍රශ්න 04 කට ඔබ විසින් සපයාගත් කඩදාසි භාවිතාකර පිළිතුරු සැපයිය යුතුය.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 05 කි. මෙම කොටසට ලකුණු 120 ක් හිමි වේ.**

I කොටස

01. (අ) (I) බහු සෛලික ජීවී දේහයක් ගොඩනැගීම සිදුවන සංවිධාන මට්ටම් අනුපිළිවෙල පහත දැක්වේ.

සෛලය → පටකය → ඉන්ද්‍රියය → P →ජීවියා

මෙහි P ස්ථානයට අදාලවන සංවිධාන මට්ටම කුමක් ද?

....

(ලකුණු 02)

(II) ජීවීන් වර්ගීකරණයේ දී විශාල කාණ්ඩයේ සිට කුඩා කාණ්ඩය දක්වා වර්ගීකරණ අනුපිළිවෙල පහත දැක්වේ.

රාජධානිය → වංශය → A → ගෝත්‍රය → B → ගණය → විශේෂය

මෙහි A හා B ස්ථානවලට අදාළ වන වර්ගීකරණ මට්ටම් දක්වන්න.

A .... B ....

(ලකුණු 04)

(III) ශාක වර්ගීකරණයේ දී විශාල කාණ්ඩයේ සිට කුඩා කාණ්ඩය දක්වා වර්ගීකරණ අනුපිළිවෙල පදනම් කරගත් නිර්ණායක අනුව සැකසූ ගැලීම් සටහනක් පහත දැක්වේ.



ඉහත x හා y ස්ථාන සඳහා නිවැරදි නිර්ණායක දක්වන්න. (ලකුණු 04)

